




සහන් වීරසේකර

# ස්වරමාධූර් අක්ෂරයේ දිව්‍යමය ගාන්ධර්වයා හෙවත් රොක්සාමි මාස්ටර්

බොහෝ දෙනෙක් සංහිදියාව පිළිබඳ අටවන, විපරන, දොඩවන යුගයක, අතීතයේ සිට අනාගත පරම්පරාව දක්වා ගීතයේ පරාසයන් තුල සංහිදියාත්මක කතාබහට ලක්නොවුණු, ගෞරව සම්මානයට පාත්‍ර නොවුණු ලාංකීය සංගීත පාත්‍රවර්ගයෙක් වී නම්, ඒ ඇල්පිටියෙන් ඉපිද මීට විසි හත් වසරකට පෙර, වත්තලින් නික්ම ගිය ඒ අපූරු රසවතාය, නමින් එම්. කේ. රොක්සාමි නම් සුන්දර මිනිසාය.

සුදුපාට මීදුම් ගලාලා * අර පේන කන්දේ වෙලීලා
මදහාසෙ පෙන්වා බැඳීලා * දෙදෙනාට රහසේ කියාදේ
ආදරේ........... ආදරේ.......

ගී පද මාලාව - කරුණාරත්න අබේසේකර සහ සංගිතය - එම්.කේ. රොක්සාමි
උපුටා ගැනීම ලෙනින් මොරායස්ගේ 1972 තිරගතවූ එදත් සූරයා අදත් සූරයා චිත්‍රපටය

හෙළ සංගීතයේ හමුවන සාමිලා දෙපලක් ඇත. පළමුවැන්නා, රාමයියා මුත්තුසාමි හෙවත් ආර්. මුත්තුසාමි ය. දෙවැන්නා, ඊට නොදවෙනි මරියාකොලන්දේ ක්‍රිස්ටි රොක්සාමි හෙවත් එම්. කේ. රොක්සාමි වේ. රොක් අයියාට ප්‍රසිද්ධ ජීවිතයට අත දෙන්නේ මුත්තුසාමි මාස්ටර්ය. රජයේ උප්පැන්න සහතිකයේ වූ රොක් ක්‍රිස්ටි සාමි යන නාමය ක්ෂේත්‍රයේ වැඩ කටයුතු පහසුව සඳහා අම්මාගේ නාමයෙන් මරියා කොටසද, තාත්තාගේ පරම්පරාගත වාසගම් අක්ෂරයෙන් කොලන්දේ සාමි කොටසද ඔහුට අවැසි ලෙස සංස්කරණය කර ගනී. මරියා යනු දේව මාතාව වේ, කොලන්දේ සාමි යනු ජේසු බබා යන අර්ථයයි. මරියා නමෙන් එම් අකුරත්, කොලන්දේ නමින් කේ අකුරත්, ගෙන ප්‍රසිද්ධ සංගීත දිවියේ බෞතිස්ම ලබන්නේ එම්. කේ. රොක්සාමි ලෙසය.



තම කාමරයේ නිස්කලංක පරිසරය තමයි රොක් මාස්ටර් තනු නිර්මාණ සඳහා නිජබිම කරගත්තේ. කටින් විසිල් කරමින් අළුත් තනු අස්වැද්දීම රොක් අයියාටම ආවේනික ගුණයක්. වරක් මධ්‍යම රාත්‍රිය පසු කරමින් සුවබර නින්දක සිටි රොක්, එකවරම සයනයෙන් නැගිටලා තවත් දිව්‍යමය සදාතනික ගී තනු රාජයෙක් හෙළ ගී කෙතට ජනනය කලා. කලාශූරි ලතා වල්පොලගේ මහා ගී සමුච්චියේ මුල් ගී තුන අතරේ රැඳෙන සේ ධීවරයෝ චිත්‍රපටය උදෙසා තැනුනු මධුර මනමෝහනිය තනුව නිර්මාණය වුයේ අළුයම කුරුළු කිචිබිචියටත් හොරෙන්.

**සතුට සෝකේ ජය පරාජේ - අපටමයි මේ ලෝකයේ**
**එයට පිටුපා මෙලොව මිනිසා - කිසි තැනක දී නෑ ගියේ**

ගී පද මාලාව කරුණාරත්න අබේසේකර සහ සංගිතය එම්.කේ. රොක්සාමි
උපුටා ගැනීම 1964 දී තිරගතවූ ධීවරයෝ චිත්‍රපටියෙනි.

1932 සැප්තැම්බර් 13 වෙනිදා මෙලොව එළිය දුටු රොක් අයියා පසු කලක කොම්පඤ්ඤවීදියේ ඇන්ඩර්සන් විද්‍යාලයේ ඉගෙනුම ලබමින් සංගීතයට පරිබාහිරව පාසල් සමයේ පාපන්දුවට පෙම් බැන්දා. රොක්සාමිගේ ළමා කාලය සංගීතයෙන් පිරිගිය බවත්, මවගේ අභාෂය නිසාත් පියාගේ වයලීන් වාදනය ඇසීම නිසාත් තමාගේ සංගීත ඇල්ම වැඩුණු බවත් සංගරලිංගම් නම් සංගීත ගුරුවරයා නිසා වයලීනය ප්‍රගුණ කළ බවත් පැවසේ.

**මධු මල ලෙස මෘදු මගේ ප්‍රියාදර මිහිරාවිය වෙතටයි**
**ඔබ සිහි කරකර ඔබට ලියන එක මට ඇති එක සතුටයි**

රොක් අයියාගේ මධුර තනු සදහා වචන නිදන් කිරීමේ හැකියාව මැනවින් තිබුනේ කරුණාරත්න අබේසේකර ශූරීන් තුලය. මිල්ටන් මල්ලවාරච්චි ගේ බොහෝ මුල් යුගයේ ගී ඊට මැනවින් සාක්ෂි දරයි. මෙය තනුව සාදා පසුව ගේය පද ගොනු කල ගීතයක්. තවද මිල්ටන් වෙනුවෙන් හින්දි ගී තනුවක් මුල්වරට නිර්මාණය කරන්නෙත් රොක් අයියා වීම විශේෂයි.

රොක්සාමි මෙන්ම ඔහුගේ සොහොයුරු ඇන්තනි සාමිට ද වාදනයේ නිපුණත්වය හේතුවෙන්, ආර්.ඒ. චන්ද්‍රසේන සංගීතඥයාගේ අනුග්‍රහය ලැබිණි. වයලීන වාදකයකු ලෙස මිය යන තුරාවට චිත්‍රපට 600 අධික ප්‍රමාණයක් මෙන්ම වික්ටර් රත්නායකගේ ලසල ප්‍රසංගය, නන්දා මාලිනියගේ ශ්‍රවන ආරාධනා මියැසිය මෙන්ම සනත් නන්දසිරි ගේ ප්‍රසාංගික මෙහවර උදෙසා ද ඔහුගේ දායකත්වය අපිරිමිතයි. විශේෂයෙන්ම, මුලික ගුවන් විදුලි පටිගත කිරීමට පරිබාහිරව ප්‍රසාංගික මෙහවර තුල සංගීත අලංකරණයේ ඔහුගේ ඇති හැකියාව සහ තනු වර්නවත් කිරීම සඳහා නොපසුබසින කැමැත්ත රොක් අයියාගේ වාදනවලිය තුල කැපී පෙනේ.

වික්ටර්ගේ ස ප්‍රසංගය සහ ඒ සදහා යොදා ගත් සංගීත ස්වර ප්‍රස්ථාර තුල අතිරේක සටහන් වල නියමුවා අපේ රොක් අයියා ය. අනුන්ගේ වැඩක් තමාගේ සේ සැලකීම මෙන්ම ඒ සදහා උපරිම සහයෝගය ඔහු තුලින් නිබඳව ගලා ආ බව ක්ෂේත්‍රයේ රහසක් නොවේ.

ප්‍රේමකීර්ති සහ ස්ටැන්ලි පිරිස් සුසංයෝගයෙන් බිහිවෙන ටී එම් ජයරත්න ගයන සිතින් මා නොසැලී සිටිද්දී * කඳුල නුඹ ඇවිදින්... ගීතය බිහිවන්නේ සැලසුම් කල කැසට් පටියකට ඇතිවන ගීතමය අඩු ලුහුඩු පිරවීමක් ලෙසයි. එහි එන අන්තරා කොටසේ වයලීන වාදනය හුදෙක්ම එම වාද්‍ය වෘන්දයේ සිටි රොක් අයියාගේ තරම පෙන්නු සංගීත විජ්ජාවේ එක් අවසථාවක් පමණි.

ජීවිතයේ බුද දින හෙවත් බදාදා දිනය රොක් අයියාගේ ජීවිතය පුරාවට අපූරු නෑදෑකමක් එක්කලා. රොක් මාස්ටර් ඉපදුණේ 1932 සැප්තැම්බර් 13 වැනි බදාදා දිනක. ඉන්ද්‍රාණි එලායස් සමග විවාහ වුණේ 1974 නොවැම්බර් 24 වැනි බදාදා දිනක. රොක් මේ ලෝකෙන් සමුගෙන ගියේ 1988 නොවැම්බර් 30 වැනි බදාදා දිනක. එයාගේ ජීවිතයේ වැදගත් සිදුවීම් තුනම සිද්ධ වුණේ බදාදා දිනක.

**ජීවන විල මැද වැජඹෙන කැකුලකි රූබව වූ යුවතී //**
**තී මට තී මට කියමින් බිඟු පෙල ඇය අවටම රඟතී**
**ජීවන විල මැද වැජඹෙන කැකුලකි රූබව වූ යුවතී**

ගී පද මාලාව කරුණාසේන ජයලත් සහ සංගිතය එම්.කේ. රොක්සාමි
උපුටා ගැනීම ලමහ රෑ හමුවූ ස්ත්‍රියි චිත්‍රපටියෙනි.

සුජාතා පෙරේරා හෙවත් වර්තමාන සුජාතා අත්තනායක පවසන්නේ රොක් අයියාගේ සංගීත දැනුමේ ගැඹුර සහ සංගීත අලංකෘතය කෙරෙහි තිබු හැකියාව මනාවට ප්‍රත්‍යක්ෂ වූ එක් ගීතයක් වන්නේ ජීවන විල මැද වැජඹෙන බවයි. සංගීත ස්වර පරාස තුල සෝපාන ගති ලක්ෂණ (Muisc Ladder ) ප්‍රකට කෙරෙන ආකෘතියක තනු නිමැවුමේ හිමිකරු රොක්සාමි මාස්ටර්මය.

එම්.කේ. රොක්සාමි නම් සංගීතඥයා පිළිබඳ ඇගැයීමක් කරන සෑම අවස්ථාවකම නිතැතින්ම සිහියට නැගෙන්නේ ජාතික සංහිඳියාවයි. ඒ තරමටම ඔහු මෙරට ජාතික සංහිඳියාව හා මනාව බැඳුණ චරිතයකි. ජාතියෙන් දමිළ වූ ද ආගමෙන් කිතුනුවකු වූ ද රොක්සාමි ඔහුගේ මියුරු සංගීත නිර්මාණයන් තුළින් මෙරට සියලූ ජාතීන්ගේ ද ආගමිකයන්ගේ ද සිත් සතන් දිනා ගත්තේ ය. එකල රේඩියෝ සිලෝන් වූ ගුවන් විදුලි සේවයට ඔහු එක් වූයේ වර්ෂ 1952 දී ය. ඊළඟ වසරේ ම ඔහු එහි වාද්‍ය මණ්ඩලයේ ප්‍රධානියා විය.

ගිටාරය, මැන්ඩලීනය, පියාණෝව, වයලීනය, සර්පිනාව මෙන් ම සැක්සපෝනය ද ඔහුට හුරු පුරුදු වාද්‍ය භාණ්ඩයන් වූ අතර, බටහිර පන්නයේ වාද්‍ය භාණ්ඩ වාදනය දැඩි ලෙස ගුවන් විදුලි වාදක මණ්ඩලය තුළ සීමා කොට හෝ සහමුලින්ම තහනම් කොට තිබුණ අවධියක රොක් අයියා එම වාදක මණ්ඩලයේ ප්‍රථම සැක්සපෝන වාදකයා විය.

එකල්හී බොහෝ සංගීත සහ චිත්‍රපටි පසුබිම් සංගීතයට දායක වුයේ ගුවන් විදුලි වාදක මණ්ඩල ශිල්පින්ම තමයි. සවස හතර පසුවී කාර්යාල වැඩ කටුයුතු අහවර කොට රොක්සාමි මාස්ටර් වාද්‍ය නඩයේ ඇත්තන් කැන්දාගෙන ශබ්දාගාරයට පැමිණේ. ඉන්පසු දැඩි තාක්ෂණික සහ වටපිට පාරිසරීය බාධක සමගින් ගී පුහුණු සහ පටිගත කිරීම් සදහා ප්‍රවිශ්ටය සිදුකෙරේ. එළිවෙනකම් පුරුදු පුහුණු වීමත්, බොහෝ දෙනෙක් වාද්‍ය වෘන්ද ශිල්පීන් තුල කොට කලිසම් මෙන්ම කමිස නැති උඩුකය නිරාවරණ සම්ප්‍රදාය බිහි වන්නේත්, ආසාවට වඩා ශබ්දාගාර තුල එකල්හී වායුසමීකරන නොතිබූ නීසාය. එහෙත් රොක් අයියාගේ නඩේ සිටි පැට්‍රික් දෙනිපිටියගේ ටයි පටිය නම් බුරුල් වුනේද ගැලවුනේද නැත.

ගීතයක අවසන් එලය ගැන කවදාවත් සෑහීමකට පත් නොවුණු රොක් අයියගේ නොසිදෙන දැනුම, සහ අදහස් ගලා ඒම සමහර ශිල්පින්ට වදයක් වුයේ එළිවෙනකම් ගීතයක් සදහා විදි දුකම නිසාවෙන් මිස අන්කරුණක් නිසා නොවේ. පටිගත කිරීමේ අවසානයක් දැකීමට තිබෙන ආසාව නිසාවෙන් ශබ්දාගාරය තුල තිබෙන පෑන් පැන්සල් සැඟවීම, ශිල්පින් ඉක්බිතිව පිටව යෑම සදහ, රොක් අයියාගෙන් වසන් කල උපක්‍රමයක් වේ.

සංගීත පටිගත කල හැකි මංකඩ තුනක් හෝ හතරක් වාද්‍ය වෘන්දයේ 35 හෝ 40 අතරේ සහ ගායන ශිල්පියා අතර බෙදී යයි. වාද්‍ය වෘන්දය ගායන ශිල්පියාට එරවීමත් ගායන ශිල්පියා වාද්‍ය වෘන්දයට එරවීමත් එකල්හි සුලභ වූ සිද්ධිදාමයක් වන්නේ පටිගත කිරීමේ කටුක බව නිසාමයි. සමස්තයක් ලෙස ගායකයා පුරුදු පුහුණුවී පැමිණිය යුතුයි. එකෙක් වැරදුවොත් නැවත මුල සිටම වාදනය මෙන්ම ගායනයද කලයුතු බැවිනි.

**ඔබගේ රුව මාගේමයි - සතුටේ මල් පීදේමයි**
**පෙර මග මුතු පෑදේමයි**
**ඕ..... ඕ.....**
**කිරි පැණි සේ පෑහෙමයි**

**ඔබගේ හද මාගේමයි - කතරේ මල් පීදේමයි**
**නොවිඳපු සුව සෑදේමයි**
**ඕ..... ඕ.....**
**රන් රස සේ පෑහෙමයි**

ගී පද මාලාව සුනිල් විමලවීර සහ සංගිතය එම්.කේ. රොක්සාමි
උපුටා ගැනීම ලහරිම බඩු තුනකී චිත්‍රපටියෙනි.

ඒ හැදල විජය චිත්‍රාගාරය තුල ලහරිම බඩු තුනක්ල චිත්‍රපටියේ පසුබිම් සංගීත පටිගත වෙමින් පැවති වකවානුවයි. ගායන ශිල්පී එම් එස් ප්‍රනාන්දු සහ රංජනී පෙරේරා (සුජාතා අත්තනායක සොහොයුරිය) ඒ සඳහා තෝරාගෙන තිබුනා. දැන් වාදක මණ්ඩලය මෙන්ම මර්වින් බෙන්ස් ශබ්ද පරිපාලක තුමෝ ද ක්‍රියාත්මකයි. දෙවන අංකාන්තරය කොටසද අවසන් වී වාද්‍ය වෘන්දයයේ නළුව ක්‍රියාත්මකයි. මොහොතකින් සියලූ දෙනා වාදනය සමගින් මුහුණට මුහුණ බලයි. ඇයි? දැන් මොකද වෙන්නේ. සංගීත ප්‍රබන්ධයේ අවසන් කොටස් ශිල්පීන් ට දුන් සැඳහුම තුල නොමැති වීම හැමෝටම ප්‍රශ්නාර්ථයක් මුහුණු තුල ඇති කළේය.

මොහොතකින් රොක් අයියාගේ අණ ක්‍රියාත්මකයි, ලණුැව දබ ඡක්හසබටල ශිල්පින්ට අතින් විධානයක් ලැබෙයි. සියල්ලන්ම තුෂ්ණිම්භූතව වයයි, රොක් අයියා ශබ්දාගාරයේ පසක තිබු සැක්සපෝනය අතට ගනී. සැක්සපෝනයේ ඉපියාව සවිකර ගනී. මර්වින් බෙන්ස්ගේ කණ පුරා පිරෙන සංගීත රසය, මුවගින් උතුරා යයි, අවසන් සැක්සපෝන කණ්ඩය අහල බලන්න එවිට මර්වින් බෙන්ස්ගේ මුවගේ සිනා රසය හෙට ඔබට දැනේවී.

කඳානේ සුන්දර මුරුගන් චිත්‍රාගාරයේ පටන් ගන්න වාද්‍ය ජීවිතයේ විවිධ කඩඉම් ඔස්සේ ආර් මුත්තුසාමිගේ ආශිර්වාදයෙන් තම ජීවිත යේ ප්‍රථම වරට සිංහල චිත්‍රපටයක පසුබිම් සංගීතයට වාද්‍ය ශිල්පියකු ලෙස සහභාගි වීමේ භාග්‍යය වර්ෂ 1952 දී ඔහුට හිමි වූයේ බණ්ඩා නගරයට පැමිණීම චිත්‍රපටයෙනි.

**33 වන පිටට**